**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**අවසාන වාර පරීක්ෂණය - 2011**

**කෘෂි හා ආහාර තාක්ෂණය - 10 ශ්‍රේණිය**

**කාලය :- පැය 01 යි**

## I කොටස

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. යෝධ ඇල සාදන ලද්දේ
   i. ධාතුසේන රජු   ii. මහසෙන් රජු   iii. පරාක්‍රමබාහු රජු   iv. වලගම්බා රජු

2. කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජල සම්පාදනය සඳහා අනුග්‍රහය දක් වූ මින්නේරිය දේවියෝ ලෙස විරුදවලිය ලත් රජතුමා
   i. මහසෙන් රජුය   ii. ධාතුසේන රජුය   iii. අභය රජුය   iv. වලගම්බා රජුය

3. වාර්ෂික වර්ෂාපතනය මි.මී 2500 ට වැඩි ප්‍රදේශ හඳුන්වන්නේ
   i. තෙත් කලාපය   ii. වියලි කලාපය
   iii. අතර මැදි කලාපය   iv. සංවහන වැසි කලාපය

4. වැවකින් නිකුත් කරන ජල ප්‍රමාණය පාලනය කිරීම සඳහා යොදා ගන්නා කොටස වන්නේ
   i. බිසෝ කොටුව   ii. සොරොව්ව   iii. පිටවාන   iv. රැලපනාව

5. ශ්‍රී ලංකාවේ දිගුම දිවා කාලය ඇති වන්නේ
   i. දෙසැම්බර් 24 දය   ii. දෙසැම්බර් 21 දය   iii. ජුනි 21 දය   iv. ජුනි 24 දය

6. දිවා - රාත්‍රි උෂ්ණත්ව වෙනස අස්වැන්න කෙරෙහි බලපාන බෝගය කුමක්ද?
   i. සලාද   ii. ලික්ස්   iii. අර්තාපල්   iv. තක්කාලි

7. පහත දක්වෙන ශාක වර්ග අතරින් සෙවන ප්‍රියකරන ශාක පමණක් අඩංගු පිළිතුර වන්නේ
   i. වී, උක්, ඉඟුරු, බටු   ii. ඇන්තූරියම්,කෝපි,උක්, කව්පි
   iii. උක්,ඇන්තූරියම්,කෝපි,ඉරිගු   iv. බිගෝනියා,ඇන්තූරියම්,කෝපි

8. ජනගහන පැතිකඩක මිනිස් ජීවිතයේ විවිධ වර්ධන අවධි හා විශේෂ අවස්ථා නියෝජනය වේ. ඒ අතරින් විශේෂ අවස්ථා පමනක් ඇති පිළිතුර
   i. රෝගී හා මව්කිරි දෙන අවස්ථාව   ii. යෞවන හා මව්කිරි දෙන අවස්ථාව
   iii. වැඩිහිටි හා ගර්භනී අවස්ථාව   iv. ළමා විය හා රෝගී අවස්ථාව

9. පස මත එක් රැස්වන විවිධ කාබනික ද්‍රව්‍ය ඉතා අඩුවෙන් වියෝජනය වීමට ඉඩ ඇති ප්‍රදේශයක් වන්නේ,

i. පොළොන්නරුව ii. පුත්තලම iii. නුවර එළිය iv. මාතරය

10. ආලෝකය ලබා දෙන ප්‍රධාන විභවය සූර්යයා වේ. ආලෝකය මනින උපකරණය වන්නේ

i. සූර්ය දිප්ත මානය ii. වර්ෂා මානය iii. අනිල මානය iv. ආර්ද්‍රතාමානය

11. අවසාදිත හෝ ආග්නේය පාෂාණ අධික උෂ්ණත්වය,පීඩනය හා භූ චලනයට ලක්වීම නිසා පෙරිත පාෂාන සෑදේ. උදහරන

i. කිරි ගරුඬ,නයිස් ii. හුණුගල්,වැලිගල්

iii. ග්‍රැනයිට්,ක්වායිට්ස් iv. හුණුගල්,ග්‍රැනයිට්

12. බීජ ප්‍රරෝහනයට අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර සාධක තිබියදිත් ජීවී බීජ තාවකාලිකව ප්‍රරෝහනය නොවීම,

i. බීජ ප්‍රරෝහනය ii. බීජ සුජකතාවය

iii. බීජ ජීවසකතාවය iv. බහු කලලතාවය

13. අධෝභෞම ප්‍රරෝහනය පෙන්වන බීජ කාන්ඩය

i. බඩ ඉරිඟු,වී,කඩල, ii. මුං ඇට,කව්පි,රටකජු,

iii. තල,බඩ ඉරිඟු,රටකජු, iv. තක්කාලි,වම්බටු,මිරිස්,

14. බීජ ප්‍රරෝහනය ප්‍රතිශතය සෙවීම සඳහා යොද ගත හැකි ක්‍රමයන් වන්නේ,

i. රැග්ඩෝල් ක්‍රමය ii. ඩැපොග් ක්‍රමය

iii. නෙරිඩෝකෝ ක්‍රමය iv. ජල බඳුන් ක්‍රමය

15. ශාකයක මුල් කැබැල්ලේ සිටුවීමෙන් නව ශාකයක් ලබා ගත හැකිවීම වර්ධන ප්‍රචාරණයේ තවත් කොටසකි. උදහරන ලෙස,

i. බෙලි ii. දෙඩම් iii. අඹ iv. රඹුටන්

16. මේරීමේ අවධිය අනුව දඩු කැබලි ගත හැකි ආකාර කියද?

i. තුනකි ii. දෙකකි iii. එකකි iv. හතරකි

17. ආහාර ප්‍රමිතකරණයේදි සලකා බලන කරුණක් නොවන්නේ

i. පෝෂණීය අගය ii. රසායනික සංයුතිය iii. පිරිසිදුකම iv. ආහාරයේ මිල

18. පාරිභෝගිකයන් ආහාර තෝරා ගැනිමේදි සැලකිලිමත් විය යුතු කරුනු මොනවාද?

i. පෙනුම හා වයනය ii. රසය හා පෝෂණිය වැදගත්කම

iii. කල්තබා ගැනිම iv. ඉහත සියල්ලම

19. බෝග වල පුෂ්පිකරනය සදහා වඩාත්ම බලපාන දේශගුණික සාධකය

i. උෂ්ණත්වය ii. ආලෝකය iii. සුළඟ iv. ආර්ද්‍රතාවය

20. ප්‍රධාන ආහාර වලට ආදේශන ලෙස යොදගත හැකි බෝග කාණ්ඩය වන්නේ,

i. කොස්,දෙල්,බතල ii. බෝංචි,මෑ, පිපිඤ්ඤා

iii. කුරක්කන්,කන්කුන්,ගොටුකොල iv. කොස්,දෙල්, කන්කුන්,

21. ආහාර වේලට වැඩිපුර ප්‍රෝටින් ලබාදෙන බිජ කාණ්ඩය වන්නේ

i. රාබු,ගෝවා,කැරට්, ii. කඩල,දඹල,මුං,

iii. වම්බටු,මිරිස්,තක්කාලි, iv. කරවිල,පතෝල,වැටකොළු

22. පහත සදහන් බෝග අතුරෙන් සොලන්සි කුලයට අයත් වන්නේ කුමන බෝග කාණ්ඩයද?

i. වම්බටු,මිරිස්,තක්කාලි, ii. කරවිල,පතෝල,වැටකොළු,

iii. මුං ඇට,කඩල,දඹල, iv. කුරක්කන්,බඩ ඉරිගු,මෙනේරි,

23. දේශගුණක සාධකයක් වන සුළගේ වේගය මනිනු ලබන්නේ

i. උෂ්ණත්ව මානයෙනි

ii. අනිල මානයෙනි

iii. පාන මානයෙනි

iv. වියලි හා තෙත් බල්බ උෂ්ණත්ව මානයෙනි

24. පසේ භෞතික ලක්ෂණයක් වන්නේ

i. පංශු ව්‍යුහය ii. ඔක්සිහරණය iii. සජලිකරණය iv. අම්ලිකතාවය

25. පසේ රසායනික ලක්ෂණයක් වන්නේ

i. පංශු ක්ෂාරියතාවය ii. පංශු වයනය iii. පංශු ගැඹුර iv. පංශු වර්ණය

26. ඉගුරු සහ කහ ශාඛවල සිටුවිමට ගන්නේ කුමන භූගත කඳන් වර්ගද?

i. රෛසෝම ii. කෝම iii. බල්බ iv. ආකන්ද

27. ශාක වල වැඩිමට උදව්වන පෝෂ්‍ය පදර්ථය

i. නයිට්‍රජන් ii. පොස්පරස් iii. පොටැසියම් iv. යකඩ

28. යුරියා වලින් ලැබෙන පෝෂ්‍ය පදර්ථය වන්නේ

i. පොටෑසියම් ii. නයිට්‍රජන් iii. පොස්පරස් iv. මැග්නිසියම්

29. පහත බෝග කාන්ඩ අතුරින් ධාන්‍ය බෝග කාන්ඩයට අයත් වන්නේ

i. මුං,කව්පි, කඩල,
ii. කව්පි,වී,බඩ ඉරිඟු
iii. වී,බඩ ඉරිඟු,කුරක්කන්,
iv. කඩල, කුරක්කන්,මෙනේරි,

30. කෲසිපරේසි කුලයට අයත් බෝග කන්ඩය වන්නේ

i. ගෝවා,සලාද,මල්ගෝවා,
ii. තක්කාලි,බටු,මිරිස්,
iii. පිපිඤ්ඤා,කැකැරි,වට්ටක්කා,
iv. රටකජු,දඹල,මැකරල්,

31. වගුරු බිම්වල වැඩෙන ශාක වර්ග

i. කොහිල,පන් වර්ග,කඩොලාන,
ii. නෙළුම්,බටු,තක්කාලි,
iii. පන් වර්ග,කොහිල,මිරිස්,
iv. බතල,කිරිඅල,උණ

32. බහු කලලතාවය යනු

i. බීජයක් සිටුවා නිරෝගි පැලයක් ලබා ගැනිමයි
ii. එක් බිජයකින් පැල කිහිපයක් ඇතිවිමයි
iii. අතු කැබල්ලක් සිටුවා පැලයක් ලබා ගැනිමයි
iv. කලල කීපයක් ඇති බිජ සිටුවිමයි

33. තවාන් පාත්තියක දිග හා පලල පිළිවෙලින්

i. 2mx1m ii. 3mx1m iii. 3mx2m iv. 4mx2m

34. තවාන් පාත්තියක මතුපිට පස් මිශ්‍රණය සකස් කරන අනුපාතය

i. මතුපිට පස් හා කාබනික පොහොර 1 : 1
ii. මතුපිට පස් හා වැලි 1 : 2
iii. වැලි හා කාබනික පොහොර 2 : 1
iv. කාබනික පොහොර හා ගොම 1 : 2

35. කෘමි සතුන් ගේ රූපාන්තරණ ආකාර ගණන

i. එකකි ii. දෙකකි iii. තුනකි iv. හතරකි

36. අතු බැදිම යනුවෙන් හදුන්වන්නේ

i. මව් ශාකයට සම්බන්දව තිබියදිම අතු කැබැල්ල මුල් අද්දවා ගැනිම
ii. මව් ශාකයෙන් වෙන් කොට මුල් අද්දවා ගැනිම
iii. අතු කැබලි කපා පොළව යට දමා වසා තැබිම
iv. අතු කැබලි ජල භාජනයක ගිල්වා තැබිම

37. බද්ධ කිරීමේදී අනුජය යනු

i. හොද ගති ලක්ෂන ඇති මව් ශාකයෙන් ලබා ගන්නා අංකුරක් හෝ රිකිල්ලකි

ii. පහසුවෙන් සොයා ගත හැකි ශාඛයකි

iii. යහපත් වර්ධක විලාසයක් ඇති ශාඛයකි

iv. හොඳ මුල මංඩලයක් ඇති ශාකයෙකි

38. ශාකයක් බද්ධ කල විට බද්ධ සන්ධිය හොදින් වෙලයි. වෙලිම කරන්නේ

i. පහල සිට ඉහලට හොදින් තදවන ලෙසය

ii. ඉහල සිට පහලට හොදින් තදවන ලෙසය

iii. වෙලිම එතරම් අවශ්‍ය නොවේ

iv. කුමන අයුරු හෝ තදින් වෙලයි

39. ශ්‍රී ලංකාවේ වැඩිම වර්ෂාපතනය ලැබෙන ප්‍රදේශය

i. වටවල ii. නුවර එළිය iii. හැටන් iv. ගාල්ල

40. තෙත් හා වියලි බල්බ උෂ්ණත්වයයෙන් මනින්නේ

i. උෂ්ණත්වය ii. ආර්ද්‍රතාවය iii. පිඩනය iv. වර්ෂාපතනය